## 21

ළා රෝස පාට බිත්ති සහිත "නිරංජලා සැලෝන්" එක, එසේම නිරංජලාද සිත් ගන්නා සුළු විය. මේ නිවහන තුල බිමල්ට අමුත්තක් නොදැනුනි. "ගෙදර වාගෙ" බිමල්ට කියැවිනි.

නිරංජලා අක්කා, පද්මා අක්කාට වඩා හැඩකාර වුවද, වඩාත් වැඩිමහල් වුවද බිමල්ට ඇය පිටස්තරයෙකු ලෙසින් හැඟුණේ නැත. ව්‍යාපාර කටයුතු වලදී බොහෝදෙනා හා සන්නිවේදනයේ යෙදුන හෙයින්දෝ නිරංජලා බිමල් සමඟ කුළුපග වූවාය.

"කවුන් නම් තේ බොන්න බෑ" යි බිමල් කීවේ නිරංජලා තේ බොන්න පෙරැත්ත කරද්දීය.

"ඉතිං කොහෙද මේ ඉන්න යන්නෙ? මොකද්ද මේ හදිසි ගමන?" නිරංජලා උනන්දුවෙන් ඇසුවේ, බිමල් අසලම, ලොකු සුව පහසු සෝෆාවේ හිඳ ගෙනය. ඇය වඩාත් ඇඟැලි ලෙසට කුෂන් කොට්ටයක්ද පසුපට තදල කරගන්නාය.

උත්තර දෙන්නට පෙර බිමල් වටපිට බැලුවේය. තරමක් ඉඩකඩ සහිත විසිත්ත කාමරයේ, මල් බඳුන් දෙක තුනක්ද, මහා ලියන්ගේ සේයා රූ කිහිපයක්ද විය.

"මල්ලිගෙ කාන්තා ගැන පද්මා මට කීවා." බිමල්ගේ පිළිතුරු එමාව නිසා නිරංජලා කීවාය. "දන්න තරමින් මොකද්ද උනේ කියන්න."

"කාන්තා ගෙදරින් ගිහින් දැන් දවස් තුන හතරක් උනා. සාමාන්‍යයෙන් කාන්තා අපිට කතා කරනවනෙ."

"ඉතිං?"

"ඒ ෆෝන් එක වැඩකරන්නෙත් නෑ"

"පොලීසියට කිව්වද?"

"තාම නෑ"

"ඇයි?"

බිමල් මදකට ගොළුවුනේය. අර අසික්කිත ජායාරූප ගැන මේ සුන්දර සොහොයුරියට කොහොම කියන්නද?

"කාන්තා, කතරගම යනව කියපු නිසා අපි හිතුවා එහේ වැඩ ඇති කියලා."

"ඉතිං?"

"කතරගම ගිහින් නැහැ."

"කොහොමද දන්නෙ ?"

"ම්ං - තාත්තගෙ කන්තෝරුවට කතා කෙරුවා - කතරගම ගිහින් ඇඳ - අසයින්මන්ට් එකට - බොස් කිව්වා ---"

"බොස් මොනවද කිව්වෙ ?" නිරංජලා පාවට නෙරපූ සිට් කුසිම එහා මෙහා කරන විට ඇගේ දෑතේ ප්ලාස්ටික් වළලු සැලුණි. ඇගේ රෝස පැහැ දිග සාය, ඇගේ ගෙදර බිත්ති වලට පෑහෙයි. ඈ මේ සියල්ල විමසන්නෙ - උදව්වක් කරන්නද ? නැතහොත් කුතුහලයටද ?

"අනේ මන්දා - බොස් කිව්වා තාත්තව අස් කෙරුවා කියලා"

"ඒ - මො - කද ?" නිරංජලා ඇද වැද ඇසුවාය.

"අනේ මන්දා. තාත්තා මීන කාගෙද පොතක් ලියන්න ගියාලු."

"කොහේද ? කාගෙද ?"

"ඒක තමයි අපි දන්නෙ නැත්තෙ. තාත්තා ආවෙ රාවණා ගැන ලිපියක් ලියන්න. කතරගම - රාවණා සම්බන්ධය ගැන."

"එහෙනං දඬු මොනරයෙත් අරන් ගියාද ?" නිරංජලා එසේ කීවේ සිනා මතු නොවේ. "අනේ මල්ලි - සමාවෙන්න. මට එහෙම කියවුනා. ඇත්තටම ඉතිං - තාත්තා කොහේ කියලද ගිහින්නෙ ?"

"මට හෝඩුවාවක් ආවා - කලුතරින්."

"කලුතරින් ? හෝඩුවාවක් ?"

තම ලද ඡායාරූප කීපය සවිත් බිමල්ගේ මනසේ හොල්මන් කළේය. තම තාත්තා තවත් ගැහැනියක හා සිටින ඒ ඡායාරූ ගැන නිරංජලාට කියන්නේ කොහොමද? එවන් දෙයක් ඇයට පෙන්වන්නේ කොහොමද ? ඒත් -- මද මොහොතකට බිමල් නිරංජලා දෙස බලා සිටියේ අනීරණයෙනි. අනතුරුව ඒ අනීරණය සැකයක් බවට පත්විය. ඒ ඡායාරූප වල තාත්තා හා සිටින්නේ නිරංජලා විය නොහැකිද ? දකුණු කළුතර --- නිරංජලා.. තාත්තා නිරංජලා හා සම්බන්ධතාවක් ඇති නිසාද - මේ ගමන ආවේ ? නෑ - නෑ - වෙන්න බෑ -

බිමල් පිළිතුරක් දෙන්නට පෙර, එඩිනා නම් වූ - නිරංජලාගේ සේවිකාව, බිමල්ට බොන්නට රස පැන් වීදුරුවක් රැගෙන

ආවාය. එසිනා මැදුරිය පසු කළද හැඩකාරය. සිරිවට රෙද්දක් හැට්ටියක් ඇඳ සිටී. මල් මුදුනු විසිතුරු නෙපිය තියාලාය. එහි ගාට ගාට මල් මලින් තෝරා ගත් තිල් පැහැ මලක පිළිය රැගත් හැට්ටයේ අත්, වැලමිට දක්වාය. ඇය මෙසේ සීරුවට ඇඳ පැළඳ සිටින්නේ ව්‍යාපාර කටයුතු සඳහා "කැලොග්" එකට පැමිණෙන "කාස්ටමස් ලා" ට පෙනෙන්නට ඔවුන්ගේ සිත් දිනාගන්නට විය යුතුය.

නිමල් රෝස පැහැ රස දියර සහිත වීදුරුව දකුණතින් ගෙන තොලට ළං කරනු නිරංජලා, බලා සිටියේ විමසිල්ලෙනි.

"මොකද්ද මල්ලි කළුතරින් හොස්සුවාව?"

"ම්.. මට ලියුමක් ලැබුණා. තාත්තගෙ අත් අකුරු නෙමෙයි."

"පොලිසියට පෙන්නුවද? මං දන්න අය පොලිසියෙ ඉන්නවා."

"නෑ තාම පෙන්නුවෙ නෑ- කාටවත්."

"මොනවද ලියුමෙ තියෙන්නෙ? මට කියන්න බැරිද?"

"ඉන්න පෙන්නන්න" කී නිමල් තම මල්ලෙන් ගත් ලියුම නිරංජලාට පෑවේය.

"ඔය කවරෙ තියෙන්නෙ තාත්තගෙ අත් අකුරු - ඇතුලෙ ලියුම වෙන කෙනෙක්ගෙ."

නිරංජලා ලියුම කියෙව්වේ අවිශ්වාසයෙන් හිස සලමිනි.

"සුදා!
නෝනරං සුදා. ඔයාට හොඳක් අමාරුද?
මට දැන්ම එන්ට බෑ. කතරගම ගිහින් බාරෙ
ඔප්පු කරලා එන්නං. පුතාවත් එක්කගෙන ඉන්ට.
දන්නවනෙ- දැන් මං ගඟසිරි හෝටලේ වැඩ
ඇවිත් ඉන්නට - උදයසිරි කොහේද කීලා"

"මේක මහ විකාර ලියුමක් නෙ මල්ලි" නිරංජලා කීවේ නාසික හඬකිනි. "මේක ලියලා මිනිහෙකුත් නෑ? ඉතිං ඔය කියා උදයසිරි හමුව උනාද? මේක උදයසිරි කියල කෙනෙක් අත්සන් කරලා නැහැනෙ.!"

"මං උදයසිරි හම්බ උනා."

"ඉතිං ?"

"අද උදේ දහයමාරට මුත්‍රා දෙන්න හිටියෙ - මොකද්ද මේ මගඩිය කියල අහන්න."

"ඉතිං ?"

"මිනිහා දවල් කෑමෙන් පස්සෙ අතුරුදහන් වෙලා."

"ඒ කොහොමද ?"

"එතන වැඩ කරන කව සෝමතිලක කියල මිනිහෙක් මට කිව්වෙ. උදයසිරි දවල් කෑමෙන් පස්සෙ කොහේ ගියාද නෑ."

"දැන් මොකද වෙන්නෙ ?"

"මං හිතන්නෙ මිනිහ මට මුත්‍රා දෙන්න බයට සේරම දාල පැනල යන්න ඇති. ඒ උනාට සෝමතිලක - සෝමේ, කියන මනුස්සයා අද රෑට මට කතා කරන්නං කිව්වා - මොනව හරි තොරතුරක් මිනිහ ළඟ ඇති."

"ඇයි දැන් කතා කරන්න බැරිද ?"

"මිනිහ කඩේ වැඩ - කුස්සියෙ උයන පිහන වැඩ - වේටර් වැඩ -"

"කොහේද ඔය කියන තැන ?"

"ගඟසිරි හෝටලය කියලා. පන්සියට කිට්ටුව තැනක්"

"මං සමහර විට දැකලත් ඇති. ඔය කියන තැන."

"නොදකින්න විදියක් නෑ."

"අපිට ඔය බෝඩ් කියවන්න වෙලාවක් නෑ මල්ලි."

"ඒකත් හරි. මං හිතන්නෙ කාන්තා, ඔය හෝටලේට හොඳ වැදිල තියෙනවා. කාන්තගෙ අත් අතර තියෙන ලියුම් කවරයෙ නැත්තං එතනට ගියෙ කොහොමද ?"

"කවුද දන්නෙ ? වාරෙ වෙන කොහේ හරි තැනක තිබිල ඉන් මේ කවරේ හොයාගෙන කාලා නිකං දුන්න බැරෑට - තෙල ඇඹිලෙල, මේ වගේ කැපාඩි කමක් කරන්න ඇති."

"වෙන්නත් පුළුවන්. කෝකටත් මං මේ සෝමතිලක කියන මිනිහගෙ කතාවත් අහල ඉන්න ඕනෑ - අද රෑ මිනිහ කතා කරයි. වැඩ ඉවර උනාම."

"නැත්තං මිනිහත් - මැරිලා වෙලා යාවිද ?"

විමල් නිහඬව බීම තොල ගෑවේය.

නිදහසේ කතා කරන්නට නිරංජලා අක්කා වැනි කෙනෙක් මුණ ගැසීම කොයි තරම් සහනයක් ද?

"මල්ලි මං ඔං කියන්නෙ- පොලිසියට කියන එක හොඳයි. මං මගේ සී. අයි. ඩී. පියතිලක අඳුනනවා." නිරංජලා සෙමින් කීවාය. "එයාගෙ දුවගෙ මඟුල් ගෙදර- මනාලිට ඇන්ඳෙව්වෙ මම- මම දැන් උනත් කතා කරල කියන්නං."

"දැන්ම එපා අක්කෙ"

"ඇයි? දැන් ඔය විදියට ඔයත් සැකකාරයෙක් වෙනවා."

"නෑ තාත්තා ගමනක් යනව කියලනෙ ගියෙ."

"ඉතිං? සීගොල්ලන්ට කතා කෙරුවෙ නැත්තං. මේ අපහසුංසෙ ලියුමක් ඇවිත් තියෙනවනං.."

ලියුමට වඩා නිමල්ට සිහිපත් වන්නේ අර ඡායාරූපයි. ඒවා, තමා සඟවා ගත යුතු නොවේද? තාත්තාගේ නමින් ඇලෙල් වේවා- තාත්තා පොතක් ලියන්න කියා ගිය නම්. එන්නරේ ලොක්කාවත් එහෙම කිව්ව නං...

"ඇයි මල්ලි? මොනවද හිතන්නෙ?"

"නෑ මං හිතුවෙ අද රෑට මේ මිනිහ මොනවද කියන්නෙ බලල හෙට පොලීසියට යනවා."

"ඔය ලියුම මෙහෙම ලියැවිච්ච එකක් නිසා මගේ පොලිසියටම කියන එක හොඳයි."

"ඔව්." නිමල් එය කීවේ කිසිවක් සිතා නොබලා අරමුණකින් තොරවය. යටි සිතෙන් ඔහු සිතුවේ අර ඡායාරූ තමා පොලීසියට භාර දිය යුතු නැති බවයි. ඒවා භාර දුන්නොත්... කවුද දන්නෙ සමහර විට ඒ ඡායාරූ වල නිදහා හැඳිනීමට පොලිසියට සොයා ගත හැකි වේවි.. ඒත්...

"මල්ලි-- ඔයා කාමක් හිතනවා."

"හිතන්නෙ නැතුව බෑ."

"හොඳයි අපි හෙට පොලිසියට කියමු. අද රෑ කොහේද ඔයා ඉන්නෙ?"

"යාලුවෙකුගෙ ගෙදර-"

"කොහෙද?"

"කළුතර- නාන්දිය කිට්ටුවම."

"පරිස්සමෙන්."

"හරි- හරි."

"මල්ලි මොනව හරි මෙහෙන් කාල ඉඳල යන්න."

බිමල් බිත්ති ඔරලෝසුව දෙස බැලුවේය. දන්නෙම නැතුව වෙලාව අටට කිට්ටු වුනා.

"මල්ලි ඔය යන තැන කෑම තියෙනවද ?"

බිමල් නිහඬයි.

"කොයිකටත් තියෙන හැටියකට මෙහෙන් කාල යන්න."

බිමල්ගේ නිහඬ බවම පිළිතුරක් සේ සිතූ නිරංජලා, එඩිනාට කතා කළාය. එඩිනා සාලයේ ප්‍රාදුර්භූත විය.

"එඩිනා තියෙන හැටියකට මොනවත් උයන්න. මේ මහත්තයට -"

"හොඳයි නෝනා." කී එඩිනා, "මස් මාළු කනවනෙ ?" කියා ඇසුවාය.

"මාළු නම් කනවා," බිමල් ලැජ්ජාවකින් මෙන් කීවේය.

"මාළු ඇඹුල් තියල් තියෙනවා. මං පරිප්පු හොද්දක් - සම්බෝලයක් හදන්නං වක් ගාලා," කී එඩිනා ඒ සැණින්ම මුළුතැන් ගෙයට ඇදුණාය.

"මං මල්ලිව කලින් දැකල තියෙනවා," නිරංජලා ලමට සිනාසී කීවාය.

"කොහෙද ?"

"පද්මලාගෙ ගෙදර දී - අනේ දැන් අවුරුදු කීපෙකට කලින්. පද්මලාගෙ තාත්තාගෙ මළ ගෙදරදී."

"දැන් අවුරුදු කීයක්ද ?"

"එතකොට ඔයා පොඩි කොලු හැටයා. ඒ උනාට මට මතකයි. ඔයාලගෙ තාත්තවත් මතකයි. අපි ඉතින් නිතර ඔය ගෙවල් වල යන්නෙ නැහැනෙ. පද්මලාගෙ තාත්ත මළාට පස්සෙ හැබැයිනෙම නෑ. පද්මා නං ඉඳ හිට මෙහේ ඇවිත් යනවා."

"ඔව් . මට කීවා."

"මට මෙහේ හරියට වැඩනෙ මල්ලි - ඒකයි කොහේවත් යන්න ඉවර නැත්තෙ.." දුරකථනයක් නාද විය. "ඔය පේන්නෙ නැද්ද ? දැනුත් මගෙ ගෙවල් දෙකක වැඩ තියෙනවා," කී නිරංජලා ඇගේ දුරකථනය සොයා ගියාය.

බිමල් තනිවිය. ඔහුගේ සිත දස අතකට දුවයි. තාත්තා - උදය සිරි - අම්මා - සෝමතිලක - සුලෝචනා - පද්මා - තාත්තා - මේසා -- නැවතම ඉතාලින් මේසා. ඇරාබිය -- මේසා හා තනිවීම කොයි තරම් වැදගත්ද ? දැන් පොලිසි ගානෙ

යන්න ගියොත්, 'තමා අද රෑ ඉන්නෙ කොහේද දන්නවද?'
එතකොට --- 'රෑ උගට මේ ජාගරණ වෙන.. ඒවා නංගන්නද?
තමා සැකකරුවෙකු බවට පත් උනොත්..? නෑ - නෑ
සෝම තිලකට කතා කරල ඉන්න ඕනෑ. මේසා හතිරුවිල,
ඉන්න ඕනෑ. සෝමතිලක - මේසා - නිරංවලා - මේ
හැම දෙනාම තමාගේ ජීවිත කරලියට මේ අද දින පිවිසි
අයයි. කොයි තරම් අරුම ද ජීවිතය? එක දවසක...
අමුතුම ගමනක - එහාට මෙහාට - මේ සේරම තාත්තා
ගිය ගමනක් නිසා..

දුරකථනයේ නිරංවලාගේ කතාව තරමක් දිගු විය.
ඒ විවාහ මංගලෝත්සවයක් සම්බන්ධයෙනි. ශාලාවේ යොදාගත
යුතු මල් වර්ග, ඒවායේ වර්ණ, ඒවාට ගැලපෙන රෙදි පිළි වල වර්ණ,
ඒවාට දළ වශයෙන් යන වියදම් ආදිය ද කතා කෙරුණි.
මනාලිය ඇඳුම් ඇන්දීමට යන වෙලාව ගැනද සාකච්ඡා විය.
අද කාමරේ ඇටලෙද්දී, දැවමෙද්දී විමල් ප්‍රනාන්දුගෙන් සැඟව
සාලයෙන් නික්ම ඇගේ සැලොන් එක ඇති කොටසට ඇවිද
ගියේය. එය සාලයෙන් වෙන්වූයේ විසල් ජවන් පෝරු
ආවරණ දෙකකිනි. සැලොන් එකේ කණ්ණාඩියක් මතද
තව දීර්ඝ මුහුණත සහිත අල්මාරියක ද බොරු කොණ්ඩ,
කිහිපයක් ස්ටයිරෝෆෝම් ඔලු හැඩවල රඳවා තිබිණි.
විවිධ විලාස හැඩැති කිහිපයක් විය. විමල් නිකමට
එක් බොරු කොණ්ඩයක් ගෙන තම හිස ලා ගත්තේය.
කණ්ණාඩියෙන් බැලූ විමලට සිනහා ගියේය. මේ කොණ්ඩයෙන්
තමාගේ ස්වරූපය කොයි තරම් වෙනස් උනාද? තවත් කණ්ණාඩියෙන්
මත වූ වෙස් ගන්වන ඇඳ ගන්වන අඳුන්, කල්කා, පුයර,
කියුටෙක්ස් ලිප්ස්ටික් ආදිය සිහුගේ ඇස ගැටුණි. මේ සියල්ල
කොයි තරම් නම් කෙනෙකුගේ ස්වරූපය වෙනස් කරයිද?

නිරංවලා දුරකථන සංවාදය අවසන් කෙරෙන
"බායි" හඬ ඇසෙන විටම විමල් බොරු කොණ්ඩය
හිසෙන් ඉවත් කර පෙර තිබුණ තැනම තබා යළිත්
සාලයට පිවිසියේය.

නිරංවලා දුරකථන කතා බොහොම පසු විමලට යමක්
කියාගෙන මුළුතැන් ගෙයට ගියේ එමිනා උදව් කරන්නට විය යුතුයි.
විමල් සාලයේ තනිවිය.

මේ සුන්දර මොහොතේ කාන්තා මතකයට නැගී ආවේය. කාන්තා කාටවත් විරුද්ධව යමක් ලියන කෙනෙක් නොවේ. කාන්තා කතා කරන ලියන සත්‍යය සිදු කරන ගවේෂණ කුතුහලය ඇති කරන විෂය මිස පහර දෙන විෂය නොවේ. මේ නිසා කාන්තාට පහරන් දැනැයි සිතිය නොහැක. එහෙත් ඇතැම් උදවිය කෙනෙකුට සතුරු කම් කරන්නේ - කිසිම හේතුවක් නැතිව විය හැකිය - ඇතැම් විට - ඊර්ෂ්‍යාවෙන් - ද්වේශයෙන්.

අනතුරුව බිමල් අම්මා ගැන සිතුවේය. අම්මා, දැන් නම් බොහොම අරන් නිදි ඇති. දැන් අම්මා, කාන්තා ගැන වචනයක් නොකී, බිමල් ගැනත් තැවෙනවා ඇති. බිමල්ට මොනවා උනාද කියා බය ඇති. හෙට දින ගෙදර යන්නට බිමල් සිතා සිටියේය.

අද ද සෝමතිලක දෙන පත්‍රිකාව යමක් තීරණය කරාවි.

අද ද... අද ද මේසා අමුතු විට කුමකින් කුමක් සිදුවේද? අද ගැන සිතන්නම ඔහුගේ මුළු සිරුරේම උණුසුමක් දැනෙන්නට විය. අද දින ද තමාගේ ජීවිතයට පත් වුණේ කෙතරම් ආශිර්වාදද? ඇය නිසා නොවේ නම් - තමාට අද රාත්‍රියේම නිවා ගෙදර යන්නට තිබිණි.

ඇයව මදකට අමතක කරන්නට මෙන් බිමල් මේසය මත තිබූ සඟරාවක් ගෙන පිටු පෙරළන්නට විය. එහි වෙළඳ දැන්වීමක සිටි තරුණියකගේ දෑස ඔහුට දැන් සිහිපත් කළේ සුලෝචනාවයි. සුලෝචනා - ලස්සන දෑස් - සුලෝචනා අද කවදාවත් නැති තරම් උනන්දුවකින් කතා කළේ.. සුලෝචනා, මේසාට වඩා කොච්චරම් වෙනස්ද? සුලෝචනා නම ලබාලයි. නම ලෝකෙ රටේ ගැන දන්නෙ නැත - සම කෝලය - හිරි බතට ලැජ්ජා බය - පෙරහැරටම වැසුණු සුලෝචනා. හරියට කෝෂයක හිරවුණු සමනලියෙක් වගේ. මේසා ඒ කෝෂය බිඳගෙන එළියට ඇවිත් නිදහසේ පියඹා යමින් මල් සොයන සමනලියක් වගේ.

"මල්ලි මූණ කට ටිකක් හෝදගන්න. චින්තක වගේ කෑම ටික ලෑස්තියි" කාලයට ආ නිරංජල, කීවාය.

"එන්න."

ඇය ඔහුට නාන කාමරය වෙන්කූවාය. සුවඳ කැවූ අලුත්ම තුවායක් දුන්නාය.

නාන කාමරයේ බිත්තිත් ලා රෝස පැහැයකි. සියල්ල සිරුවට පිළිවෙලට තිබේ. බිමල් සීතල් වතුරෙන් දිය දෙතා ගත්තේය. ඇඟට නව පණක් ලැබිණි. ඔහු කෑම මේසය වෙතට එන විට, ~~[illegible]~~ දුම් දමන බතුත්, මාලුත්, පරිප්පු හොද්දත් සම්බෝලයත් මේසය මත විය.

ඔහු මේසය අසල හිඳගත් පසු නිරෝෂලා පිඟානට කෑම බෙදූ දුන්නාය. "මන්න තව බෙදූ ගෙන කන්න" කී ඇය අසල පුටුවක හිඳ තමාටද පිඟානක් බෙදා ගත්තාය.

"ඉතින් අද ඔය කොහේද ඉන්න යන්නෙ?" යැයි ඇය ඇසූවිට,

"යාළුවෙකුගෙ ගෙදර" කියා බිමල් පිළිතුරු කෙටි කළේය.